---

# බියගම ප්‍රාදේශීය සභාව
# ගම්පහ දිස්ත්‍රික්කය

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 අප්‍රේල් 11 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 30 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 ජනවාරි 21 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

### 1.2 මතය

මාගේ වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් හේතුකොට ගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති බියගම ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) කලින් ලද වරිපනම් හා බදු ප්‍රාදේශීය සභා ආකෘති 7 අනුව වටිනාකම් නොගැලපීම හේතුකොට ගෙන කලින් ලද ආදායම් ගිණුම රු.3,602,741 ක් අඩුවෙන්ද හිඟ හිටි වරිපනම් ගිණුමේ ශේෂය රු.242,099 ක් වැඩියෙන්ද ගිණුම්ගත වී තිබුණි.

(ආ) 2012 වර්ෂය තුළ නිකුත් කරන ලද රු.5,481,413 ක නිකුත් කිරීම් පොදු ගබඩා ගිණුමට ගලපනු වෙනුවට රු.5,316,786 ලෙස සමුච්චිත අරමුදලට ගලපා තිබූ අතර, වැය ශීර්ෂ වලට රු.164,627 ක් අඩුවෙන් ගණුම්ගත කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී ආධාර වශයෙන් ලැබීතිබූ රු.2,286,040 ක් පරිත්‍යාග ලෙස ගිණුම්ගත කරනු වෙනුවට ගබඩා ණයහිමි ගිණුමට බැර කර තිබුණි.

(ඈ) සමාලොචිත වර්ෂය තුල මිලදී ගත් රු.809,434 ක්වූ ඖෂධ තොග මිලද ගන්නා අවස්ථාවේදීම ආයුර්වේද නිකුත්කිරීමක් ලෙස ගිණුම්ගත කර තිබූ අතර වර්ෂය අවසානයේදී ඖෂධ තොග සම්බන්ධ සමීක්ෂණයක් සිදුකර අවසන් තොගය ගණනය කර නොතිබුණි.

(ඉ) 2012 වර්ෂයේදී සභාව සතු දේපලක්වූ කඩවත වෙළඳ පලෙහි කඩ 31 සඳහා රු.66,026 ක්ද, අධිවේගී මාර්ගය ඉදිකිරීමට රජයට පවරාගත් දේපළ 115 සඳහා රු.133,357 ක්ද, බිල්කර වරිපනම් ගිණුම් ගත කිරීම නිසා වරිපනම් ආදායම රු.199,383 කින් වැඩියෙන් දැක්විණි.

(ඊ) ස්ථාවර වත්කම් ලේඛනය අනුව ඉඩම් කොටස් 10 ක් සඳහා වූ රු.9,805,240 ක ඉඩම් හා ගොඩනැගිලි යටතේ ගිණුම්ගතවී නොතිබුණි.

(උ) 2012 වර්ෂයේ ස්ථාවර වත්කම් වැඩි දියුණු කිරීම සඳහා අවස්ථා 2 කදී දරන ලද රු.1,108,345 ක වියදම ස්ථාවර වත්කම්වලට ඇතුළත් කර නොතිබුණි.

(ඌ) වත්කම් ලේඛනයේ ඇතුළත්කර තිබූ ත්‍රීරෝද රථ 2 සහ වතුර බවුසරයේ වටිනාකම් මෝටර් රථ ගිණුමට ඇතුළත් කර නොතිබුණි.

(එ) මාකොළ බහුකාර්ය ගොඩනැගිල්ල ඉදිකිරීම වෙනුවෙන් කරන ලද වැඩ විස්තර අනුව මධ්‍යම ඉංජිනේරු කාර්යංශයට ගෙවියයුතු හිඟ මුදල රු.4,917,213 ක් වුවද, ඒ සඳහා වෙන් කිරීම් කර නොතිබුණි.

(ඒ) 2012 දෙසැම්බර් 07 දින ඝන අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියෙන් පරිත්‍යාග ලෙස ලැබුණු රු.1,379,000 වටිනා ට්‍රැක්ටරය තොග ගිණුම හර කර ගබඩා ණයහිමි ගිණුමට බැර කර තිබුණි.

1.3.2 <u>විගණනය සඳහා සාක්ෂි නොවීම</u>

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.10,829,750 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

2. <u>මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය</u>

2.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.21,706,928 ක් විය. ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.11,461,930 ක් විය.

2.2 <u>මූල්‍ය පාලනය</u>

1988 ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීති මාලාවේ 155 රීතිය හා මුදල් රෙගුලාසි 261(3) අනුව ප්‍රා.ස.10 ආකෘතිය ප්‍රකාරව ප්‍රධාන මුදල් පොතක් ප්‍රධාන කාර්යාලයේ පවත්වාගෙන යා

යුතු අතර, ඒ අනුව බැංකු සැසඳීම් ප්‍රකාශ පිළියෙල කළ යුතු වුවත් සභාව විසින් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

2.3 <u>ආදායම් පරිපාලනය</u>

2.3.1 <u>ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්</u>

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තු ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.000" | රු.000" | රු.000" |
| (i) | වරිපනම් හා බදු | 56,729 | 27,227 | 50,247 |
| (ii) | බදුකුලී | 2,176 | 1,441 | 4,168 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,484 | 2,700 | 698 |
| (iv) | වෙනත් ආදායම් | 892 | 968 | 245 |

2.3.2 <u>වරිපනම් බදු</u>

2012 දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් බදු රු.45,542,135 ක්වූ ශේෂය තුළ වසර 1 සිට 5 දක්වා රු.10,913,933 ක්වූ ශේෂයක්ද, වසර 5 ඉක්මවූ රු.1,059,120 ක ශේෂයක්ද අයකර ගැනීමට ලේකම්වරයා විසින් කටයුතු කර නොතිබුණි.

මෙම ශේෂය තුළ දෙල්ගොඩ උපකාර්යාලයට අයත රු.5,000 ඉක්මවන හිඟ හිටි වරිපනම් ශේෂයවූ රු.1,033,250 ක්ද විය.

2.3.3 <u>බලපත්‍ර ගාස්තු</u>

2012 දෙසැම්බර් 31 දිනට රු.4,146,620 ක්වූ වර්ෂ 1 සිට 5 දක්වා වූ සහ වසර 5කට වැඩි හිඟ හිටි වෙළඳ බලපත්‍ර ශේෂය අයකර ගැනීමට ලේකම්වරයා කටයුතු කර නොතිබුණි.

2.3.4 <u>කඩවත වෙළඳපොල කඩ කාමර බදු දීම</u>

කඩ කාමර 59 ක් ඉදිකර තිබූ අතර, 1989 වසරේ සිටම බදුදීම සිදුකර තිබුණි.මෙම කඩ කාමර වසර 20 කට අධික කාලයක සිට බදුදී ඇතත් විගණිත දිනයවූ 2013 අගෝස්තු 27 දින වන විටත් විධිමත් ගිවිසුම් අත්සන් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.3.5 **වෙනත් ආදායම්**

2012 දෙසැම්බර් 31 දිනට වර්ෂ 1 කට වැඩි හා වර්ෂ 5 ට අඩු හිඟ වෙළඳ ස්ථාන කුලී රු.398,878 ක් හා වර්ෂ 5 ඉක්මවන හිඟ වෙළඳ ස්ථාන කුලී ශේෂය රු.3,555,310 ක් අයකර ගැනීමට ක්‍රියාකර නොතිබුණි.

2.4 **අවිධිමත් ගනුදෙනු**

(අ) අඩු ආදායම්ලාභී පවුල් 23 ක් සඳහා වැසකිලි ඉදිකර ගැනීමට එක් අයෙකුට රු.20,000 ක් බැගින් රු.460,000 ක් සමාලෝචිත වර්ෂයේ දී ගෙවා තිබුණද මුදල් අදාල කාර්යය සඳහා යෙදු බවට වගකිවයුතු නිලධාරීන් පසු විපරම් කටයුතු කර නොතිබුණි.

(ආ) 2012 වර්ෂය සඳහා ගොඩනැගිලි ද්‍රව්‍ය ලබා ගැනීම සඳහා රු.5,394,975 ක් ගෙවා තිබු අතර ඉදිරිපත් කර තිබු මිල ගණන් තාක්ෂණික දැනුමක් ඇති නිලධාරියෙකු විසින් ඇගයීමක් කර නොතිබුණි.

2.5 **කොන්ත්‍රාත් පරිපාලනය**

**මාකොළ බහුකාර්ය ගොඩනැගිල්ල ඉදිකිරීම**

ගම්පහ දිස්ත්‍රික් නගර සංවර්ධන වැඩසටහන යටතේ පළාත් සභා ආධාර වලින් බියගම ප්‍රාදේශීය සභාවේ පරිහරණය සඳහා මාකොළ බහුකාර්ය ගොඩනැගිල්ල ඉදිකිරීමට සභාව සහ මධ්‍යම ඉංජිනේරු උපදේශක කාර්යාංශය 2002 වර්ෂයේ රු.17,380,000 ක්වූ ගිවිසුමකට එළඹ තිබුණි. ඉදිකිරීම් සඳහා රු.7,000,000 ක් 2002/2003 වසර වලදී වැයකර තිබූ අතර, පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(i) සභාවට නීතිමය හිමිකමක් නොමැති ඉඩමක මෙම ව්‍යාපෘතිය ආරම්භකර තිබූ අතර, රූඩ්2 පර්.35.2 ක්වූ මෙම ඉඩම ආයෝජන මණ්ඩලය වෙත 1991 නොවැම්බර් 22 දින බියගම ප්‍රාදේශීය ලේකම් විසින් පවරන ලද්දකි. වර්තමානයේ එම ඉඩම නැවත ප්‍රාදේශීය ලේකම් වෙත භාර දුන්නද විගණිත දිනවූ 2013 අගෝස්තු 30 දින දක්වාද මෙම ඉඩමේ අයිතිය නිරවුල් කර සභාවට පවරාගෙන නොතිබුණි.

(ii) ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව කටයුතු කර නොතිබූ අතර, මෙම ව්‍යාපෘතියේ හදිසිතාවය මත මාස 03 කින් වැඩ නිම කිරීමට ටර්න්කී ක්‍රමයට කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. නමුත් මෙම ව්‍යාපෘතිය ආරම්භකර විගණිත දිනට වසර 11 ක් ගතවී ඇතත්, එහි වැඩ නිමකර පරිහරණය කළහැකි

තත්ත්වයකට පත්ව නොතිබුණු බව 2013 අගෝස්තු 30 කරන ලද භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

(iii) 2004 අප්‍රේල් 15 වන විට නිමකරන ලද වැඩ සම්බන්ධයෙන් ගෙවියයුතු රු.4,917,243 මුදල සභාවට මුදල් නොමැතිකම යනාදී හේතු මත කොන්ත්‍රාත්කරුට නොගෙවා ඉදිකිරීම් කටයුතු අතරමග නවතා තිබුණි. 2012 වර්ෂය සඳහා අයවැය ප්‍රතිපාදන වලින් රු.ලක්ෂ 10 ක් වෙන්කර තිබියදීත් සමාලෝචිත වර්ෂයේ කිසිදු කටයුත්තක් සිදුකර නොතිබුණි.

## 2.6 <u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) පුස්තකාල පොත් සමීක්ෂණ වාර්තාව අනුව සමීක්ෂණයට ඉදිරිපත් නොවූ පොත් සංඛ්‍යාව 1,277 ක් වූ අතර, ඉන් පොත් 615 ක් පසුගිය වර්ෂයේදී අස්ථානගතවූ පොත් විය. මේ සම්බන්ධව රජයේ මුදල් රෙගුලාසි ප්‍රකාරව වගකිවයුතු නිලධාරීන්ගෙන් අයකර ගැනම සඳහා විධිමත් පරීක්ෂණ පවත්වා කටයුතු කිරීමක් සිදුකර නොතිබුණි.

(ආ) බස්නාහිර පළාත් ආදායම් කොමසාරිස්ගේ 2012 ඔක්තෝබර් 18 දිනැති ලිපිය අනුව සභාවට ලැබියයුතු රු.4,270,360 ක් වූ මුද්දර ගාස්තු සම්බන්ධව දක්වා ඇති අඩුපාඩු සකස්කර නැවත ඉදිරිපත් කරන ලෙස දන්වා ඇතත් සභාව විසින් 2013 අගෝස්තු වන විටත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

## 2.7 <u>වාහන කුලියට ගැනීම</u>

2012 වර්ෂයේදී සභාව විසින් සභා බල ප්‍රදේශය තුළ කසල ඉවත් කිරීමට ට්‍රැක්ටර් 10 ක් හා ලොරි රථයක්ද, විදුලි කටයුතු සඳහා ත්‍රී රෝද රථ 04 ක්ද, මාර්ග අංශයේ කටයුතු සඳහා ලොරි රථයක් හා ටිපර් රථයක්ද, කුලී පදනම මත ලබාගෙන තිබූ අතර, ඒ සඳහා රු.10,828,150 ක් ගෙවා තිබුණි.

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) වැය ඇස්තමේන්තුවක් පිළියෙල කර නොතිබුණි.

(ආ) ලියාපදිංචි සහතික හා රක්ෂණ බලපත්‍රවල පිටපතක් ලබාගෙන නොතිබුණි.

---

(ඇ) කුලියට ගත් වාහන සඳහා සර්වග්‍රාහී රක්ෂණයක් ලබාගෙන තිබියයුතු වුවත්, මෙම කුලී රථ සඳහා තුන්වන පාර්ශ්වීය රක්ෂණාවරණ ලබාගෙන තිබුණි.

(ඈ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9 ඡේදය අනුව විධිමත් ගිවිසුමකට එළඹ නොතිබුණි.

(ඉ) කුලියට ගත් වාහන 6 ක් සඳහා ගෙවීම් කිරීමේදී දිනකට ධාවනය වියයුතු අවම කිලෝමීටර් ගණනවත් ධාවනය නොකර තිබියදී සම්පූර්ණ මුදලම ගෙවීම් කිරීම නිසා රු 375,600 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඊ) ධාවන සටහන් නිසි පරිදි සම්පූර්ණ කර නොතිබුණි.

(උ) ත්‍රී රෝද රථ 6 ක් විදුලි කටයුතු සඳහා යෙදවූ බවට විදුලි අංශයේ ද්‍රව්‍ය නිකුත් කිරීමේ ආකෘති පත්‍ර අනුව තහවුරු නොවූ නමුත්, එම කටයුතු සඳහා යෙදවූ බවට දින 39 ක් වෙනුවෙන් රු.58,500 ක් ගෙවීම් කර තිබුණි.

(ඌ) සභාව සතු ට්‍රැක්ටර් 4 ක් අළුත්වැඩියා කිරීමකින් තොරව දීර්ඝ කාලයක් තිස්සේ ගරාජ්වල ගාල්කර තිබූ අතර, 2012 හා 2013 වර්ෂවලදී ට්‍රැක්ටර් හා ට්‍රේලර් 3 ක් පරිත්‍යාග වශයෙන් සභාවට ලැබී තිබියදීත් කුලී පදනම මත ලබාගත් රථ අඩුකර්මක් සිදුකර නොතිබුණි. 2013 අගෝස්තු 30 විගණිත දින වන විටත් ට්‍රැක්ටර් 7 ක් කුලියට ලබාගෙන තිබුණි.

(එ) කුලී පදනම මත ලබාගෙන තිබූ ඇතැම් කුලී රථ සභාවේ සේවයේ නියුතු නිලධාරීන් සතු බවත් වෙනත් නමකින් කුලී රථ සභාවට යොදවා ඇති බවත් වාර්තා විය.

2.8 <u>පාරිසරික හා සමාජ වගකීම් ඉටු කිරීම</u>

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) කසළ ඉවත් කිරීම සඳහා දිනකට රු.3,400 බැගින් ට්‍රැක්ටර් 05 ක් සඳහා වර්ෂයකට රු.6,120,000 ක මුදලක් ඇස්තමේන්තුකර තිබුණත් සභාව විසින් 2012 වර්ෂයේදී කසළ බැහැර කිරීම වෙනුවෙන් රු.8,010,350 ක් ගෙවීම් කිරීම නිසා රු.1,890,350 කින් ඇස්තමේන්තුව ඉක්මවා ගෙවීම් කර තිබුණි.

(ආ) කසළ බැහැර කිරීම සඳහා මල්වානේ පිහිටි ඉඩමක් භාවිතාකර තිබූ අතර, එම කසළ ආවරණය සඳහා පස් දමා තුනි කිරීම වෙනුවෙන් පස් කියුබ් 1 ක් රු.1,900 බැගින්

වසරකට පස් කියුබ් 1440 ක් සඳහා රු.2,736,000 ක් ඇස්තමේන්තුකර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

(i) සමාලෝචිත වර්ෂය සඳහා පස් කියුබ් 2650 ක් භාවිතා කර රු.4,590,000 ක් ගෙවා තිබීම නිසා රු.1,854,000 කින් ඇස්තමේන්තුව ඉක්මවා තිබුණි.

(ii) කසළ බහාලන ස්ථානයට පස් ලබා ගැනීමේදී එම ස්ථානයට සෘජුවම ප්‍රවාහනය සිදුකර තිබුණි. පස් රැගෙන එන අවස්ථාවේ සභාවේ බලය ලත් නිලධාරියෙකුගේ අධීක්ෂණයකට හෝ පරීක්ෂාවකට ලක් කර නොතිබූ අතර, එම ස්ථානයේ සිටින ලේඛන නඩත්තු කරන කම්කරු නිලධාරියා විසින් වාහනයේ දිග පළල හා උස අනුව කියුබ් ගණන ලකුණුකර ගැනීම සිදුකර තිබුණි. දින පතාම පස් රැගෙන එන මුත් තාක්ෂණික නිලධාරී විසින් දින තුනකට වරක් පරීක්ෂා කර ඒ අනුව කොන්ත්‍රාත්කරුට ගෙවීම් කර තිබුණි. මේ සම්බන්ධයෙන් පවතින අභ්‍යන්තර පාලනය දුර්වල තත්ත්වයක පවතන අතර, මේ සඳහා ගෙවන ලද මුදලෙහි ආර්ථික භාවය හා ඵලදායිතාවය පිළිබඳ විගණනයේදී සෑහීමකට පත්විය නොහැක.

(iii) පස් තුනී කිරීමට මිනි ස්කැවේටරයක් පැයකට රු.2,750 බැගින් වර්ෂයකට වියදම රු.2,970,000 ක් ලෙස ඇස්තමේන්තුකර තිබූණි. මේ සඳහා පැයකට රු. 4,500 බැගින් කරන ලද වියදම රු.4,305,000 ක් වූ අතර, ඇස්තමේන්තුව ඉක්මවූ මුදල රු.1,335,000 ක් විය.

(iv) දිනකට වරක් යන්ත්‍රයක් මගින් පස් කසළ උඩට දමා තුනී කරන බව පැවසුවද එය අධීක්ෂණ නිලධාරියෙකු ඉදිරියේ සිදුකරන බවක් නොපෙනුණි.

(ඇ) කසළ ඉවත් කිරීම සඳහා කුලී පදනම මත ට්‍රැක්ටර් ලබා ගැනීමට හා පස් තුනී කිරීමට යන්ත්‍රයක් ලබා ගැනීම වෙනුවෙන් රු.12,315,350 ක් වැය කිරීම ආර්ථිකමය හා ඵලදායී නොවන්නක් බව නිරීක්ෂණය කරනු ලැබේ.

(ඈ) කසළ බැහැර කිරීමේ ව්‍යාපෘතියේ එක් අරමුණක් ලෙස භූගත ජල පද්ධතිය හා ජල මාර්ග දූෂණය වීම වලක්වා ගැනීම දක්වා තිබුණද, කසළ මෙලෙස ගොඩ ගැසීමෙන් එම අරමුණ ඉටු නොවන බවද, අපද්‍රව්‍ය බැහැර කරන ස්ථානය ආසන්නයේ පිහිටි කැලණි ගඟ පිටාර ගැලීමක් සිදු වුවහොත් පරිසරයට බලපෑමක් සිදුවන බවද නිරීක්ෂණය විය.

(ඉ) පළාත් පාලන කොමසාරිස් විසින් මෙම ව්‍යාපෘතිය සඳහා අනුමැතිය දුන් ලිපියේ 6 ඡේදය ප්‍රකාරව සම්පත් පියස හා සම්පත් කේන්ද්‍ර භාවිතයක් සිදුකර නොතිබුණි.

(ඊ) කසළ සභාවේ දේපළක් වන හෙයින් ඒ ගැන සැලකිලිමත් වී කසළ ජනනය වන ස්ථාන වලදීම වර්ගීකරණය කර ඒවා සුදුසු පරිදි ප්‍රතිචක්‍රීකරණය කිරීමට හෝ කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය කර ආදායමක් උපයා ගැනීමට හෝ යොමු වීමක් කර නොතිබූ

අතර, සභාවේ දේපලක් වන කසල බැහැර කිරීමට 2012 වර්ෂයේදී රු.21,955,584 ක් වැය කර තිබුණි.

3. <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අභ්‍යන්තර විගණනය

(ඇ) වත්කම් කළමනාකරණය

(ඈ) වාහන උපයෝජනය